# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2079/7 - 2018 ජූලි මස 09 වැනි සඳුදා - 2018.07.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) වගන්තිය යටතේ ඌව පළාත් ආණ්ඩුකාරවර ආරිය බී. රැකව වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පහත සඳහන් පත්කිරීම් සිදු කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වන පංතියේ නිලධාරිණී ඩී. එම්. විනිතා දිසානායක මහත්මිය, තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අතිරේකව 2018.05.02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට,

2) ඌව පළාත් ආයුර්වේද කොමසාරිස් පී. ඩබ්. ඩබ්. දිසානායක මහතා 2018.06.07 වැනි දින සිට 2018.06.22 දින දක්වා විදේශගත වන බැවින්, 2018.06.07 දින සිට ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, සහකාර ආයුර්වේද කොමසාරිස් එම්. පී. එස්. කරුණාරත්න මහත්මිය, තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අතිරේකව, ඌව පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුරේ රාජකාරී ආවරණය කිරීමට,

3) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි ආර්. එම්. ටී. බී. හාතියල්දෙණිය මහතා, තම නිත්‍ය තනතුරේ රාජකාරිවලට අතිරේකව 2018.06.10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම් තනතුරේ වැඩ බැලීමට,

4) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පංතියේ නිලධාරි දයානන්ද රත්නායක මහතා, වහාම ක්‍රියාත්මක වන පරිදි (2018.06.04 දින සිට) ඌව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ, පළාත් ඉඩම් කොමසාරිස් වශයෙන්.

ආරිය බී. රැකව,
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2018 ජූලි මස 04 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

07-770


1A - PG 4107— 57 (2018/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*